

# මොබිටෙල් සමාගමට සම්මානයක්

ශ්‍රී ලංකාවේ තරුණ පරපුරේ අවශ්‍යතා තේරුම් ගැනීම සහ සපුරාලීම සඳහා කැපවී කටයුතු කිරීම වෙනුවෙන් එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානයෙන් (SUNFO) පිරිනැමෙන "තරුණ පරපුර උදෙසා සන්නිවේදනය" නම් ජාතික සම්මානය මොබිටෙල් සමාගම වෙත පිරිනමා ඇත. මොබිටෙල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ලලිත් ද සිල්වා මහතා (SUNFO) නිලධාරීන් අතින් සම්මානය ලබාගත් අවස්ථාව මේ අවස්ථාවට සහභාගි වූ තොරතුරු හා මාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය සේගු ඉසඩීන් මහතාද ජායාරූපයේ සිටී.